රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක: 142

මගේ අංකය: 2/3/9(එච්) 111(111)
රාජ්‍ය පරිපාලන හා ස්වදේශ
කටයුතු පිළිබඳ අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 7. 1979 ජූලි මස 30 දින.

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානයන් සහ
රාජ්‍ය සංස්ථා ප්‍රධානයන් වෙත.

## රජයේ නිලධරයන්ගේත්, පළාත්පාලන සහ රාජ්‍ය අංශයේ වෙනත් සේවකයන්ගේත් සේවය වෛකල්පිත විශ්‍රාම වයසින් ඔබ්බට දීර්ඝ කිරීම.

අදාළ ඇමතිවරයාගේ නිර්දේශයක් අනුව, සියලුම රජයේ නිලධරයන්, පළාත්පාලන සේවකයන් සහ රාජ්‍ය සංස්ථා සේවකයන් සම්බන්ධයෙන් වයස අවුරුදු 58 න් ඔබ්බට සේවය දිගු කිරීමේ බලය අමාත්‍ය මණ්ඩලය තමන් වෙත රඳවා ගන්නා බව කියැවෙන, 1979 අප්‍රේල් 03 දාතමින් යුතු රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 135 වෙත අවධානය යොමු කළ මැනවි.

02. රජයේ නිලධරයන්ගේත්, පළාත්පාලන සහ වෙනත් රාජ්‍ය අංශයේ සේවකයන්ගේත් සේවය වයස අවුරුදු 58 න් ඔබ්බට 60 දක්වා දිගු කිරීමේ බලය අදාළ ඇමතිවරයාට දිය යුතු යයි ඉක්බිතිව අමාත්‍ය මණ්ඩලය විසින් තීරණය කර ඇත.

03. එසේ වෙතත්, අතිරේක අමාත්‍යාංශ ලේකම්වරුන්, දෙපාර්තමේන්තු ප්‍රධානයන්, දිසාපතිවරුන් සහ අමාත්‍යාංශවල ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්වරුන් සම්බන්ධයෙන් වයස අවුරුදු 58 න් ඔබ්බට සේවය දිගු කිරීමේ බලය අමාත්‍ය මණ්ඩලය තමන් වෙත රඳවා ගෙන ඇත.

04. 1979 අප්‍රේල් 03 දාතමින් යුතු රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 135 මෙපරිද්දෙන් සංශෝධිත බව සැලකිය යුතුය.

අ.ක/ ඩී.බී.අයි.පී.එස්.සිරිවර්ධන
රාජ්‍ය පරිපාලන හා ස්වදේශ
කටයුතු අමාත්‍යාංශයේ
ලේකම්.

අතිරේක ආයතන අධ්‍යක්ෂ